ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>සාගර් බන්ධු මෙහෙයුම යටතේ ඉන්දිය හමුදා කණ්ඩායම මහියංගනයේ අත්‍යාවශ්‍ය සන්නිවේදන ජාල යථා තත්ත්වයට පත් කරයි</u>**

ඉන්දිය හමුදාවේ ශත්‍රුජිත් සේනාංකයේ ඒකාබද්ධ කාර්ය සාධක බලකාය විසින් දිට්වා සුළි කුණාටුවෙන් වැඩිම හානියක් සිදු වූ මහනුවර ආශ්‍රිත ප්‍රදේශයක අත්‍යාවශ්‍ය සන්නිවේදන යටිතල පහසුකමක් යථා තත්ත්වයට පත් කරන ලදී.

2. සුළි කුණාටුව හේතුවෙන් මහියංගනය ප්‍රදේශයේ ඔප්ටික් ෆයිබර් කේබල් (OFC) ජාලය දැඩි ලෙස හානි වී තිබූ අතර ඒ හේතුවෙන් විශාල ප්‍රදේශයක සන්නිවේදන කටයුතු ඇණ හිට තිබිණ. ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම (SLT මොබිටෙල්) විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව ඉන්දිය හමුදා කණ්ඩායම කඩිනමින් ක්‍රියාත්මක විය. දුෂ්කර පෙදෙසක අභියෝගාත්මක කාලගුණික තත්ත්වයන් යටතේ කණ්ඩායම ඉන්දිය ක්ෂේත්‍ර රෝහල අසල BTS කුළුණ මතට ගසක් කඩා වැටීම හේතුවෙන් හානි වී තිබූ OFC ජාලය වෙත ළඟා වීමට සමත් විය. මෙම කණ්ඩායම නිරවද්‍ය ලෙස තාක්ෂණික ප්‍රවීණතාවයෙන් සිවිල් සහ මෙහෙයුම් ජාල දෙකක සඳහාම සම්බන්ධතාවය යථා තත්ත්වයට පත් කළේය. මෙම තීරණාත්මක අවස්ථාවේ සන්නිවේදනය කඩිනමින් යථා තත්ත්වයට පත් වන බව සහතික කරමින් මහියංගනයේ ප්‍රාථමික සන්නිවේදන වළල්ල යළි ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට මෙම මෙහෙයුම තුළින් හැකි විය.

3. මේ අතර සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මුදිත හංසක විජේමුණි මහතා සහ සෞඛ්‍ය සහ ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා මහියංගනයේ ක්‍රියාත්මක ඉන්දිය යුධ හමුදා ක්ෂේත්‍ර රෝහල නැරඹීමට ගියහ. ඔවුහු ගංවතුරෙන් පීඩාවට පත් ජනතාවට රෝහල විසින් ලබා දෙන හදිසි ප්‍රතිකාර, වෛද්‍ය පහසුකම් සහ ජීවිත සුරැකීමේ සහය ඇතුළු මානුෂීය සහය නිරීක්ෂණය කළ අතර එම කටයුතු අගය කළහ.

4. ඉන්දියාව පුළුල් සහ කාලෝචිත ක්‍රියාමාර්ගයන් සමඟින් මෙම අර්බුදකාරී අවස්ථාවේදී ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දීමට සූදානමින් සිටියි. මානුෂීය සහන සහ වෛද්‍ය පහසුකම්වලට අමතරව, මෙම සහයෝගයට අත්‍යාවශ්‍ය පොදු සේවාවන්හි අඛණ්ඩතාවය සහතික කිරීම සඳහා හදිසි මෙහෙයුම් අවශ්‍යතාවන්ට කඩිනම් සහ තීරණාත්මක මැදිහත් වීම් ද ඇතුළත් වේ. මෙම ප්‍රයත්නයන් අර්බුදයට දක්වන ප්‍රතිචාරය ශක්තිමත් කරන අතර ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ ශක්තිමත්ව රැඳී සිටීමට ඉන්දියාවේ නොසැලෙන කැපවීම අවධාරණය කරයි.

***

**කොළඹ**
***2025* දෙසැම්බර් *11***